# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,900—1942ක්වූ අප්‍රෙල් මස 2 වෙනි දිනවූ බෘහස්පතින්දා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීමයි.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට ඒනම්:—පස්සර මීයන්ට ඇතුල්වීමට තුපුරුවන් ධාන්‍ය ගබඩාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියා කරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

නො. 39යේ මුල් සිතියමේ නො. 1යේ අතිරේකය. ගම—කහපොළ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 95 | කැන්නෙහේනේවත්ත, වර්ජපනම් නො. 83B දරණ ඉඩමෙන් කොටසක් | මුඩුබිම .. | .. ආර්. රංගසාමි සහ ආර්. පෙරුමාල් | 0 | 0 | 1·61 |
| 96 | එම .. | .. එම .. | .. එම .. | 0 | 0 | 0·37 |
| 97 | එම .. | .. වත්ත, අවුරුදු 30–40 කොස්ගසක් සහ පැපොල්ගසක් තිබේ | ඒ. ඇස්. අබ්දුල් මූමින් කාන් | 0 | 0 | 21·46 |
| 98 | එම | .. මුඩුබිම .. | .. එම .. | 0 | 0 | 3·90 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහුකර තිබෙන කැවියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1942ක්වූ අප්‍රෙල් 28වෙනි දින පෙරවරු 10යේ කාපිසමට පස්සර ගම්සභාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ මාර්තු මස 24වෙනි දින
බදුල්ලේ කච්චේරියේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
ආණ්ඩුවේ ඒජන්ත වර්ගය.

---

### සුප්‍රීම් උසාවියේ දැන්වීමයි.

ශ්‍රී ලංකාවිපගේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙයින් ප්‍රකාශ කරන්නේනම් ගාළු දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1942ක්වූ අප්‍රෙල් මස 27වෙනි දින පෙරවරු 10 පැය පටන් ගාල්ලෙ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම්දෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුරුවන් බවත් මෙයින් සෑම්දෙනාටම දන්වන්නෙමි.

වර්ෂ 1942ක්වූ මාර්තු මස 26වෙනි දින
ගාල්ලෙ පිස්කල් කන්තෝරුවේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටුවර්ට්,
දූ. ප. පිස්කල් වර්ගය.

---

### අන්‍ය දැන්වීම්.

මීගමු දිස්ත්‍රික්කයේ දසියපත්තුවේ හීනටියන පදිංචි දිනයාදුර ඇලිස් සිල්වා විජයසිංහ වන මා කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතුකරන ප්‍රසිද්ධ නොතාරිස් නිලයට පත්කරනු ලබන පිණිස මේ දින සිට මාස තුනක් ඉකුත්වූ පසු රිජිස්ත්‍රාර් ජනරල්තුමන්ගෙන් ඉල්ලුම්කරන බව (91වෙනි පරිච්ඡේදය වන) නොතාරිස් ආඥාපණතේ පළමුවෙනි උප ලේඛනයේ B කොටසේ 2වෙනි නියෝගය යටතේ මෙයින් දැනුම්දෙමි.

දි. ඇ. සි. විජයසිංහ.

හීනටියන, කටුනායක.
6. 3. 1942.

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර කොටමුනේ කළුතර බද්දේ දූවේගම පදිංචි බෙනරහමගේ ඒරන් අයිසෙක් ද සිල්වා ජයතිලක වන මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතුකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූ පසු රෙජිස්ට්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලුම්කරන බව වර්ෂ 1907යේ අංක 1 දරණ ආඥාපනතේ 1 කී උප ලේඛනයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ඒ. බී. ඇස්. ජයතිලක.

දූවේගම, කළුතර.
10. 3. 1942.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.

43——J. N. A 12124—45 (3/42)
S 1